**ශීර්ෂය 425 - වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය**

----------------------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මතය

-------

වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 අගෝස්තු 02 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 නොවැම්බර් 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට

හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙනයනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 වියදම් කළමනාකරණය**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වැය විෂයන් 06 ක එකතුව රු.610,000 ක ප්‍රතිපාදන හා පුනරාවර්තන වැය විෂයන් 02 ක එකතුව රු.475,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත අවශ්‍යතා ඇති නොවීම, වියදම් පාලනය කිරීම මත ඉතිරිවීම් සිදුවීම, නව අමාත්‍යාංශයක් බැවින් ගොඩනැගිලි හා යන්ත්‍ර පුනරුත්ථාපන කටයුතු සඳහා අවශ්‍යතා ඇති නොවීම, මිලදී ගැනීම් කටයුතු සඳහා කොවිඩ් වසංගතය මත කාලය ප්‍රමාණවත් නොවීම සහ උපකරණ වල මිල ගණන් වැඩිවීම මත මිලට ගත නොහැකි වීම වැනි හේතු දක්වා තිබුණි. | මු.රෙ.50 විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයන් 05 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 කට වැඩියෙන් හා පුනරාවර්තන වැය විෂයන් 27 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ට වැඩියෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ප්‍රාග්ධන හා පුනරාවර්තන වැය විෂයන් සඳහා සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදන රු.540,639,500 ක් වූ අතර ඉන් රු.316,990,917 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසන්ගත තත්වය හේතුවෙන් වියදම් සීමාවීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම / කළ නොහැකි වීම. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අංක 425-2-3-8-2506 දරන වැය විෂයය යටතේ ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා වූ අයවැයගත ප්‍රතිපාදන රු.343,000,000 ක් වන අතර ඉන් රු.1,310,500 ක් මු.රෙ.66 යටතේ වෙනත් වැය විෂයයකට මාරුකර තිබූ අතර ඉන් පසුවද මෙම වැය විෂයයෙහි ඉතිරිය රු.266,498,342 ක් හෙවත් සියයට 77 ක් විය. | සැලසුම් කරන ලද වැඩ සටහන් කොවිඩ් 19 වසංගත තත්වය මත ක්‍රියාත්මක කළ නොහැකි වීම. | -එම- |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------------ | ------------ |
| (අ) | වර්ෂයට අදාළ රු.309,238 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශනයට [සටහන් අංක **(iii)]** ඇතුළත්කර නොතිබුණි. | අතපසු වීමකින් බැරකම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. ඉදිරියේදී නිවැරදිව සටහන් කිරීමට සටහන් කර ගතිමි. | බැරකම්වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ වැය විෂයයන් 3 ක් යටතේ සලසා තිබූ රු.2,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළ රු.1,894,223 ක් උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.105,777 ක් විය. එම ඉතිරිය ඉක්මවා රු.2,913,777 ක බැරකම් සඳහා බැදී තිබුණි. | **I.** 425-02-3-003-2201 - ඉදිරියේදී එසේ නොවීමට නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරමි.<br>**II.** 425-01-01-10-2001 - නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත වීම මත අත්‍යාවශ්‍ය කටයුතු සඳහා බැදීම් වලට එළඹිය යුතු වීම.<br>**III.** 425-01-01-0-1409 - මු.රෙ.94 අනුව පසුගිය වර්ෂ 3ක ප්‍රතිපාදන වල සාමාන්‍යයෙන් 50% කට වැඩිනොවන බැදීම් වලට එළඹිය හැකි වීම. | මු.රෙ. 94 ට පටහැනිව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් හා බැදීම් ඇතිකර නොගත යුතුය. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මු.රෙ.371 (5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්ත්කාර්යය ඇතුරු අග්‍රිම නිරවුල් කළයුතු වුවත් අමාත්‍යාංශයේ නිලධාරීන් 3 දෙනෙකු විසින් අවස්ථා 8 කදී ලබාගෙන තිබුණු රු.185,887 ක අතුරු අග්‍රිම පියවීම සඳහා දින 12 දිට දින 26 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | කොවිඩ් 19 වසංගත සමයේ නිලධාරීන්ට ලබාදුන් තත්ත්කාර්යය අතුරු අග්‍රිම පියවීම සඳහා රජයේ නිවාඩු දින පැවතුන බැවින් පියවීම ප්‍රමාදවී ඇත. අදාළ නිලධාරීන්ට මේ පිළිබඳ දැනුවත් කරමි. | මු.රෙ.371 (5) විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.4 අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඒසීඑස්- 3 ආකෘතියෙහි දක්වා ඇති පරිදි 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන මුදල් ශේෂය රු.56,218,580 ක් විය. එම ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මූල්‍ය වත්කම් යටතේ මාර්ගස්ථ මුදල් ලෙස දැක්විය යුතු වුවත් අමාත්‍යාංශ එලෙස දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ආකාරය නිවැරදි වේ. මුදල් පොත හරහා 2020/12/31ට භාණ්ඩාගාරය ගිණුම් පියවා ඇති අතර එය වාර්තා වීම සිදු වන්නේ ඊට පසු මාසයේදී භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අමාත්‍යාංශයේ පොත් අනුව පිළියෙල කරන්නක් බැවින් එය සිදුකර ඇති ආකාරය නිවැරදි වේ. ඒසීඒ 3හි දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර වෙනස්කමක් ඇත. මෙම අගය දක්වනුයේ ඒ අනුව වේ. | මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ දැක්විය යුතුය. |

## 2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **බැරකම් පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙනගොස් නොතිබුණි. | ඉදිරියේදී බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කරමි. | මු.රෙ. 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. |

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** භාණ්ඩාගාර අවසන් පරිගණක මුද්‍රිත සටහන අනුව රු.1,881,271 ක රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් මුදලින් ගෙවීම් හා රු.1,755,756 ක හරස් සටහන් මගින් ගෙවීම් ගිණුම් ගත වී ඇති නමුත් එකී අගයන් දෙපාර්තමේන්තු පොත්වලට ඇතුළත්වී නොතිබුණි. | 2020 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ගිණුම් කටයුතු සිදුකළ අතර එහිදී එම අමාත්‍යාංශයේ අත්තිකාරම් බී ගිණුමට කළයුතු ගිණුම්ගත කිරීම් මෙම අමාත්‍යාංශයේ අත්තිකාරම් බී ගිණුම යටතේ ගිණුම්ගත කර තිබීම මත මෙම අමාත්‍යාංශයේ පොත්වලට ඇතුළත් කර නැත. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| **(ආ)** භාණ්ඩාගාර අවසන් පරිගණක මුද්‍රිත සටහන් අනුව වර්ෂය තුළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් මුදලින් ලැබීම් රු.1,898,461ක් හා හරස් සටහන් මගින් ලැබීම් රු.1,266,421 ක් වූ නමුත් එම ලැබීම් දෙපාර්තමේන්තු පොත්වලට ඇතුළත් වී නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | ඉහත සඳහන් (අ) සහ (ආ) නිරීක්ෂණවල සඳහන් ශේෂ ගිණුම්ගත කිරීමට අදාළ මාරු පත්‍ර, ගිණුම් සාරාංශ යන ආදී ලිපි ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට කොවිඩ් වසංගත තත්වය නිසා නිලධාරීන් බොහෝමයක් රාජකාරී කටයුතු සඳහා නොපැමිණෙන බැවින් ඉදිරියේදී ඉදිරිපත් කරමි. | අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>**(අ) මු.රේ. 427** | දෙපාර්තමේන්තු ගිණුම් පොත් භාණ්ඩාගාර පොත් සමග සසඳා මාසිකව භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතු වුවත් අමාත්‍යාංශ විසින් අමාත්‍යාංශ ගිණුම් පොත් භාණ්ඩාගාර පොත් සමග සැසඳීමක් සිදුකර මාසික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත පරිදි සැසඳුම් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සැසඳීම් කළ යුතුය. |
| (ආ) මු.රෙ. 1646 | අමාත්‍යාංශය සතු වාහන 14 කට අදාළ දෛනික ධාවන සටහන් ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත් සමඟ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපති වෙත එවිය යුතු වුවත් අමාත්‍යාංශය සතු වාහනවලට අදාළ ධාවන සටහන් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත ධාවන සටහනක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළව සකසා සහතික කරන ලද බැංකු සැසඳුම් වාර්තා විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | 2020 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස වලට අදාළ සහතික කරන ලද බැංකු සැසඳුම් වාර්තා නොපමාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | සහතික කරන ලද බැංකු සැසඳුම් විගණනට ඉදිරිපත් කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හෙළ සුවය ක්‍රමවේදය භාවිතා කරමින් අක්කර 10,000 ක් වගාකර පාරම්පරික වී කිලෝග්‍රෑම් 18,000,000ක අස්වැන්නක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් නියමු ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භකර තිබුණි. මේ සඳහා අවශ්‍ය දේශීය බිත්තර වී ගොවීන්ගෙන් මිලදී ගැනීමට හා හෙළ සුවය ගොවිතැනට අවශ්‍ය ඖෂධ දියර මිලදී ගැනීම රු.මිලියන 82.6 ක ප්‍රතිපාදන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 13 ක් වියදම්කර වගාකර තිබුණේ අක්කර 3,153 ක් පමණක් වන අතර ඉන් ලබාගෙන තිබූ අස්වැන්න කිලෝග්‍රෑම් 1,9744,359 ක් විය. | මෙම ව්‍යාපෘතිය මගින් හෙක්ටයාරයකට ලබාගත හැකි වූ සාමාන්‍ය අස්වැන්න කි.ග්‍රෑම්. 1,546 කි. එහෙත් මෙම අගය 2018 වසරේදී ජාතික වී අස්වැන්නේ සාමාන්‍ය අගය හෙක්ටයාරයකට කි.ග්‍රෑම් 4,443 සමඟ සැසඳීමේදී මෙම ව්‍යාපෘතියෙන් ලද අස්වැන්න සාපේක්ෂව ඉතා අඩු අගයක් ගන්නා බව පෙනී යයි. | පරීක්ෂණ හෝ අත්හදා බැලීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී එහි ඉලක්ක ප්‍රායෝගික විය යුතු අතර නෛතික බාධා නොතිබිය යුතු වේ. යෙදවුම් හා නිමවුම් සසඳා ලබාගත් තීරණ මත ව්‍යාපෘතියේ සාර්ථක, අසාර්ථක බව පිළිබඳ නිශ්චිත තීරණයක් ගත යුතු වේ. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු.4,577,267 ක මූල්‍ය නොවන වත්කම් වර්ගීකරණය කර ඊට අදාළ සංකේතාංක ලබාදී එම වත්කම් ප්‍රධාන ලෙජර් ගිණුම් යටතේ (ඒසීඒ 6 ආකෘතියෙහි) ගිණුම්ගත කර නොතිබුණු අතරම මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයටද ඇතුළත්කර නොතිබුණි. | අතපසු වීමකින් 2020 දෙසැම්බර් මාසයේදී වත්කම් ගිණුම්ගත කර නොමැති අතර 2021 වර්ෂයේ ජනවාරි මස ගිණුම්ගත කර ඇත. | මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |